# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 2455/09 – 2025 සැප්තැම්බර් මස 23 වැනි අඟහරුවාදා – 2025.09.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39(අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2024 මාර්තු මස 07 වැනි දින අංක 2374/31 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2024 අංක 05 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්
සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/17/2023/D/78.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: 4/1/ඉ.අත්./කො.ආ.මණ්/114/2023.

2025 සැප්තැම්බර් මස 11 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**1 වන උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 723 රණාවන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අටමුනේ සහ රණාවන ගම්වල පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද KU/MLL/2023/495 හා 2023.11.24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කැබලි වලට මායිම්:

**01. කැබලි අක්ෂර A – රණාවන/රණාවනවත්ත - ප්‍රමාණය හෙක්. 1.8958**

උතුරට: මු. පි. කු. 263 හි 4 වැනි බිම් කැබැල්ල; නැගෙනහිරට: මු. පි. කු. 263 හි 4 සහ 1 වැනි බිම් කැබලි සහ මෙම අනුරේඛනයේ B වැනි බිම් කැබැල්ල; දකුණට: B වැනි බිම් කැබැල්ල; බටහිරට: B වැනි බිම් කැබැල්ල සහ මු පි. කු.263 හි 1 වැනි බිම් කැබැල්ල.

**02. කැබලි අක්ෂර B – අටමුනේ /රණාවනවත්ත - ප්‍රමාණය හෙක්. 16.3151**

උතුරට: C වැනි බිම් කැබැල්ල, මු. පි. කු 263 හි 1 වැනි බිම් කැබැල්ල, මෙම අනුරේඛනයේ A වැනි බිම් කැබැල්ල සහ මාර්ගය (ප්‍රාදේශීය සභා ); නැගෙනහිරට: මු.පි.කු. 263 හි 1 වැනි බිම් කැබැල්ල, මු. පි. A. 984 හි 2 වැනි බිම් කැබැල්ල සහ එල්. එම්. ජයවර්ධන සහ තවත් අය හිමිකම් කියන දූම්මලපිටිය සහ හුඹස්මුනේවත්ත; දකුණට: එල්. එම්. ජයවර්ධන සහ තවත් අය හිමිකම් කියන දූම්මලපිටිය සහ හුඹස්මුනේවත්ත සහ මාර්ගය (ප්‍රාදේශීය සභා ); බටහිරට: එච්. බී. විජේකෝන් හිමිකම් කියන අඹගහමුලපිටිය, පල්ලේ ගැට්ටුවාන ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ මෙම අනුරේඛනයේ C වැනි බිම් කැබැල්ල.


1A – G 045427 – 10 (2025/09)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**03. කැබලි අක්ෂර D – අටමුනෝ /රණවනවත්ත - ප්‍රමාණය හෙක්. 1.9471**

උතුරට: මු. පි. කු 263 හි 1 වැනි බිම් කැබැල්ල; නැගෙනහිරට: මු. පි. කු. 263 හි 1 වැනි බිම් කැබැල්ල, මෙම අනුරේඛනයේ C වැනි බිම් කැබැල්ල සහ පල්ලේ ගැට්ටුවාන ග්‍රාම නිලධාරි කොට්ඨාසය; දකුණට: පල්ලේ ගැට්ටුවාන ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ මෙම අනුරේඛනයේ E වැනි බිම් කැබැල්ල; බටහිරට: පල්ලේ ගැට්ටුවාන ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ මු.පි. කු. 263 හි 1 වැනි බිම් කැබැල්ල.

**04. කැබලි අක්ෂර F – අටමුනෝ /රණවනවත්ත - ප්‍රමාණය හෙක්. 0.0763**

උතුරට: E වැනි බිම් කැබැල්ල; නැගෙනහිරට, දකුණට, සහ බටහිරට: පල්ලේ ගැට්ටුවාන ග්‍රාම නිලධාරි කොට්ඨාසය.

EOG 09 – 0213